සියලු ම හිමිකම් ඇවිරිණි.

රහසය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 02 - රසායන විද්‍යාව

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

PAPERMASTER.LK

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 02 - රසායන විද්‍යාව (නව නිර්දේශය)

## ලකුණු බෙදීයාම

| | | | |
|---|---|---|---|
| **I පත්‍රය** | **01 X 50** | **=** | **50** |

**II පත්‍රය**

| | | | |
|---|---|---|---|
| **A කොටස :** | **4 X 100** | **=** | **400** |
| **B කොටස :** | **2 X 150** | **=** | **300** |
| **C කොටස :** | **2 X 150** | **=** | **300** |
| **එකතුව** | | **=** | **1000** |
| **II පත්‍රය සඳහා අවසාන ලකුණු** | | **=** | **100** |

PAPERMASTER.LK

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................... √ $\frac{4}{5}$

(ii) ..................................................... √ $\frac{3}{5}$

(iii) ..................................................... √ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

PAPERMASTER.LK

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

PAPERMASTER.LK

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

විෂයය අංකය / பாட இலக்கம்: 02 විෂයය / பாடம்: රසායන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 2 | 21. | 3 | 31. | 5 | 41. | 4 |
| 02. | 3 | 12. | 3 | 22. | 4 - 5 | 32. | 2 | 42. | 1 - 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 5 | 43. | 3 |
| 04. | 2 | 14. | 2 | 24. | All | 34. | 4-5 | 44. | 4 |
| 05. | All | 15. | All | 25. | All | 35. | 1 | 45. | 5 |
| 06. | 1 | 16. | 3 | 26. | 1 | 36. | 5 | 46. | 1 |
| 07. | 2 | 17. | 1 | 27. | 5 | 37. | 3 - 5 | 47. | 4 |
| 08. | 4 | 18. | 1 | 28. | 5 | 38. | 4 | 48. | 1 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 4 | 49. | 3 |
| 10. | 2 | 20. | 2 | 30. | 2 | 40. | 5 | 50. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

PAPERMASTER.LK

1. (*a*) පහත දැක්වෙන ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු සපයන්න.

(i) $Na^+$, $Mg^{2+}$ සහ $F^-$ යන අයන තුන අතුරෙන්, **කුඩාම** අයනික අරය ඇත්තේ කුමකට ද? ..... $Mg^{2+}$

(ii) C, N සහ O යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, **වැඩිම** දෙවන අයනීකරණ ශක්තිය ඇත්තේ කුමකට ද? ..... O

(iii) $H_2O$, HOCl සහ $OF_2$ යන සංයෝග තුන අතුරෙන්, **වඩාත්ම** විද්‍යුත් සෘණ ඔක්සිජන් පරමාණුව ඇත්තේ කුමක ද? ..... $OF_2$

(iv) Be, C සහ N යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, වායුමය අවස්ථාවේදී පරමාණුවකට ඉලෙක්ට්‍රෝනයක් එකතු කළ විට $[Y(g) + e \rightarrow Y^-(g); Y = Be, C, N]$ ශක්තිය පිටකරනුයේ කුමක් ද? ..... C

(v) NaF, KF සහ KBr යන අයනික සංයෝග තුන අතුරෙන්, ජලයේ **වැඩිම** ද්‍රාව්‍යතාව ඇත්තේ කුමකට ද? ..... KF හෝ KBr

(vi) HCHO, $CH_3F$ සහ $H_2O_2$ යන සංයෝග තුන අතුරෙන්, **ප්‍රබලම** අන්තර්-අණුක බල ඇත්තේ කුමකට ද? ..... $H_2O_2$

**(04 ලකුණු X 6 = 24)**

**1(a): ලකුණු 24**

(*b*) (i) $N_2O_3^{2-}$ අයනය සඳහා **වඩාත්ම** පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත.





**(06)**

(ii) මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) **තුනක්** අඳින්න. ඉහත (i) හි අඳින ලද වඩාත්ම පිළිගත හැකි ව්‍යුහය සමග සංසන්දනය කිරීමේදී ඔබ විසින් අඳින ලද ව්‍යුහවල සාපේක්ෂ ස්ථායිතාවයන් සඳහන් කිරීමට එම ව්‍යුහ යටින් '**අඩු ස්ථායී**' හෝ '**අස්ථායී**' වශයෙන් ලියා දක්වන්න.



(02) අඩු ස්ථායී (01)

(02) අස්ථායී (01)

(02) අස්ථායී (01)

(iii) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.





| | $N^1$ | $N^2$ | $O^3$ | $C^4$ |
|---|---|---|---|---|
| පරමාණුව වටා VSEPR යුගල් | 3 | 3 | 4 | 2 |
| පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | තලීය ත්‍රිකෝණාකාර | තලීය ත්‍රිකෝණාකාර | චතුස්තලීය | රේඛීය |
| පරමාණුව වටා හැඩය | තලීය ත්‍රිකෝණාකාර | කෝණික/ V | කෝණික/ V | රේඛීය |
| පරමාණුවේ මුහුම්කරණය | $sp^2$ | $sp^2$ | $sp^3$ | $sp$ |

PAPERMASTER.LK

**(01 X 16 = 16)**

- කොටස් (iv) සිට (vii), ඉහත (iii) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්-ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iii) කොටසෙහි ආකාරයටම වේ.

(iv) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\sigma$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක/මුහුම් කාක්ෂික හඳුනාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | $Cl—N^1$ | Cl | $3p$ හෝ $sp^3$ | $N^1$ | $sp^2$ |
| II. | $N^1—O$ | $N^1$ | $sp^2$ | O | $2p$ හෝ $sp^3$ |
| III. | $N^1—N^2$ | $N^1$ | $sp^2$ | $N^2$ | $sp^2$ |
| IV. | $N^2—O^3$ | $N^2$ | $sp^2$ | $O^3$ | $sp^3$ |
| V. | $O^3—C^4$ | $O^3$ | $sp^3$ | $C^4$ | $sp$ |
| VI. | $C^4—N$ | $C^4$ | $sp$ | N | $2p$ හෝ $sp$ |

**(01 X 12 = 12)**

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\pi$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | $N^1—N^2$ | $N^1$ | $2p$ | $N^2$ | $2p$ |
| II. | $C^4—N$ | $C^4$ | $2p$ | N | $2p$ |
| | | $C^4$ | $2p$ | N | $2p$ |

**(01 X 6 = 06)**

(vi) $N^1$, $N^2$, $O^3$ සහ $C^4$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^1$ $120^\circ \pm 1$, $N^2$ $115 - 118^\circ$, $O^3$ $104^\circ \pm 1$, $C^4$ $180^\circ \pm 1$.

**(01 X 4 = 04)**

(vii) $N^1$, $N^2$, $O^3$ සහ $C^4$ පරමාණු විද්‍යුත් සෘණතාව **වැඩිවන** පිළිවෙළට සකසන්න.

$C^4 < N^2 < N^1 < O^3$ **(03)**

**1(b): ලකුණු 56**

(c) පහත සඳහන් තොරතුරු සලකන්න.

I. **A** සහ **B** පරමාණු සංයෝජනය වී $\sigma$ බන්ධනයක් සහිත විෂමජාතීය ද්විපරමාණුක **AB** අණුව සාදයි. මෙය **A – B** ලෙස නිරූපණය කරනු ලැබේ.

II. **A** වල විද්‍යුත් සෘණතාවය **B** වල එම අගයට වඩා අඩු ය ($X_A < X_B$).
X = පරමාණුවේ විද්‍යුත් සෘණතාවය

III. පහත දැක්වෙන සමීකරණයෙන් **AB** අණුවේ **A** සහ **B** පරමාණු අතර අන්තර්-න්‍යෂ්ටික දුර ($d_{A-B}$) ලබා දේ.

$$d_{A-B} = r_A + r_B - c(X_B - X_A)$$

r = පරමාණුක අරය; c = 9 pm

**සැ.යු.:** d සහ r පිකෝමීටරවලින් (pm) මනිනු ලැබේ. (1 pm = $10^{-12}$ m)

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) **A** සහ **B** අතර $\sigma$ බන්ධන වර්ගය හඳුනාගැනීමට යොදාගන්නා නම කුමක් ද?

ධ්‍රැවීය සහබන්ධනය **(03)**

(ii) **AB** අණුවෙහි භාගික ආරෝපණ ($\delta$+ සහ $\delta$–) ස්ථානගත වී ඇත්තේ කෙසේදැයි පෙන්නුම් කරන්න.

$A^{\delta+}— B^{\delta-}$ **(03)**

(iii) **AB** අණුවේ ද්විධ්‍රැව සූර්ණය ($\mu$) ගණනය කිරීමට භාවිත කරන සමීකරණය ලියා එහි දිශාව පෙන්නුම් කරන්න.

$\mu = d_{AB} \times \delta$, හෝ $\mu = qr$ , $\overrightarrow{A — B}$ හෝ $\overrightarrow{A — B}$ (crossed arrow) **(01 + 01)**

PAPERMASTER.LK

(iv) පහත දැක්වෙන දත්ත උපයෝගී කරගනිමින් HF අණුවේ H–F බන්ධනයේ අයනික ස්වභාවයේ ප්‍රතිශතය ගණනය කරන්න.

| | | | |
|---|---|---|---|
| $H_2$ වල අන්තර්-න්‍යෂ්ටික දුර ($d_{H-H}$) | = 74 pm | F වල විද්‍යුත් සෘණතාවය | = 4.0 |
| $F_2$ වල අන්තර්-න්‍යෂ්ටික දුර ($d_{F-F}$) | = 144 pm | HF වල ද්විධ්‍රැව ඝූර්ණය | = $6.0 \times 10^{-30}$ C m |
| H වල විද්‍යුත් සෘණතාවය | = 2.1 | ඉලෙක්ට්‍රෝනයක ආරෝපණය | = $1.6 \times 10^{-19}$ C |

$\mu = d_{HF} \times \delta$,   $H^{\delta+}— F^{\delta-}$

$r_H = \frac{d_{H2}}{2} = \frac{74}{2} = 37$ pm **(02)**

$r_F = \frac{d_{F2}}{2} = \frac{144}{2} = 72$ pm **(02)**

එමනිසා , $d_{HF} = 37 + 72 - 9(4.0 - 2.1)$ **(01)**

$= 109 - 9 \times 1.9$

$= 91.9$ pm **(02)**

$\mu = d_{HF} \times \delta$,   $6.0 \times 10^{-30}$ C m $= \delta \times 91.9 \times 10^{-12}$m **(01)**

$\delta = \frac{6.0 \times 10^{-30}}{91.9 \times 10^{-12}} = 0.65 \times 10^{-19}$ **(02)**

අයනික ස්වභාවයේ ප්‍රතිශතය $= \frac{0.65 \times 10^{-19}}{1.6 \times 10^{-19}} \times 100$ **(01)**

$=$ **40.6%** **(01)**

හෝ

$r_H = \frac{d_{H2}}{2} = \frac{74}{2} = 37$ pm **(02)**

$r_F = \frac{d_{F2}}{2} = \frac{144}{2} = 72$ pm **(02)**

එමනිසා, $d_{HF} = 37 + 72 - 9(4.0 - 2.1)$ **(01)**

$= 109 - 9 \times 1.9$

$= 91.9$ pm **(02)**

$\mu$ අයනික $= 1.6 \times 10^{-19}$ C $\times$ $91.9 \times 10^{-12}$ m **(03)**

$= 147.04 \times 10^{-31}$ C m

අයනික ස්වභාවයේ ප්‍රතිශතය $= \frac{6 \times 10^{-30}}{147.04 \times 10^{-31}} \times 100$ **(01)**

= **40.8%** **(01)**

2. (*a*) **A, B, C** සහ **D** යනු *p*-ගොනුවට අයත් මූලද්‍රව්‍යවල ක්ලෝරයිඩ වේ. මෙම මූලද්‍රව්‍යවල පරමාණුක ක්‍රමාංක 20 ට අඩු ය. **A** සීමිත ජලය ප්‍රමාණයක් සහ **B, C** සහ **D** වැඩිපුර ජලය සමග ප්‍රතික්‍රියා කළවිට ලබාදෙන ඵලවල ($P_1 - P_9$) විස්තර පහත දී ඇත.

| සංයෝගය | | ඵලවල විස්තර |
|---|---|---|
| **A** | $P_1$ | ජාල සහසංයුජ ව්‍යුහයක් ඇති සංයෝගයක් |
| | $P_2$ | ප්‍රබල ඒකභාස්මික අම්ලයක් |
| **B** | $P_3$ | රතු ලිට්මස් නිල් ගන්වන වායුවක් |
| | $P_4$ | විරංජන ලක්ෂණ සහිත සංයෝගයක් |
| **C** | $P_5$ | ත්‍රිභාස්මික අම්ලයක් |
| | $P_6$ | ප්‍රබල ඒකභාස්මික අම්ලයක් |
| **D** | $P_7$ | ආම්ලික $KMnO_4$ ද්‍රාවණයක් අවර්ණ කරන වායුවක් |
| | $P_8$ | කලිල ඝනයක් |
| | $P_9$ | ප්‍රබල ඒකභාස්මික අම්ලයක් |

(i) **A, B, C** සහ **D** හඳුනාගන්න (රසායනික සූත්‍ර දෙන්න).

**A:** $SiCl_4$   **B:** $NCl_3$   **C:** $PCl_5$   **D:** $SCl_2$   **(04 x 4)**

(ii) $P_1$ සිට $P_9$ ඵල ලබාදෙමින් ජලය සමග **A, B, C** සහ **D** හි ප්‍රතික්‍රියාවලට තුලිත රසායනික සමීකරණ දෙන්න.

$SiCl_4 + 2H_2O \rightarrow SiO_2$ **($P_1$)** $+ 4HCl$ **($P_2$)** **(05)**

$NCl_3 + 3H_2O \rightarrow NH_3$ **($P_3$)** $+ 3HOCl$ **($P_4$)** **(05)**

$PCl_5 + 4H_2O \rightarrow H_3PO_4$ **($P_5$)** $+ 5HCl$ **($P_6$)** **(05)**

$2SCl_2 + 2H_2O \rightarrow SO_2$ **($P_7$)** $+ S$ **($P_8$)** $+ 4HCl$ **($P_9$)** **(05)**

PAPERMASTER.LK

**සටහන ; නිවැරදි සමතුලිත ප්‍රතික්‍රියා දී ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.**

(iii) පහත සඳහන් ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

I. $P_1$ සමග NaOH(aq)

$SiO_2 + 2NaOH \rightarrow Na_2SiO_3 + H_2O$ (04)

II. $P_3$ සමග Mg

$3Mg + 2NH_3 \rightarrow Mg_3N_2 + 3H_2$ (04)

III. $P_7$ සමග ආම්ලික $K_2Cr_2O_7$

$3(SO_2 + 2H_2O \rightarrow SO_4^{2-} + 4H^+ + 2e)$

$Cr_2O_7^{2-} + 14H^+ + 6e \rightarrow 2Cr^{3+} + 7H_2O$

$3SO_2 + Cr_2O_7^{2-} + 2H^+ \rightarrow 2Cr^{3+} + 3SO_4^{2-} + H_2O$ (06)

භාග ප්‍රතික්‍රියා සඳහා - කොටස් ලකුණු **(02 + 02)**

**2(a): ලකුණු 50**

(*b*) $Al_2(SO_4)_3$, $H_2SO_4$, $Na_2S_2O_3$, $BaCl_2$, $Pb(Ac)_2$ සහ KOH වල ජලීය ද්‍රාවණ අඩංගු **P, Q, R, S, T** සහ **U** **(පිළිවෙළින් නොවේ)** ලෙස ලේබල් කර ඇති බෝතල්, ශිෂ්‍යයෙකුට ලබා දෙන ලදී. ඒවා හඳුනාගැනීම සඳහා වරකට ද්‍රාවණ දෙක බැගින් මිශ්‍ර කිරීමෙන් ලැබුණු සමහර ප්‍රයෝජනවත් නිරීක්ෂණ පහත දක්වා ඇත. (Ac - ඇසිටේට් අයනය)

| | මිශ්‍ර කළ ද්‍රාවණ | නිරීක්ෂණ |
|---|---|---|
| **I** | **T + R** | පැහැදිලි අවර්ණ ද්‍රාවණයක් |
| **II** | **P + R** | සුදු අවක්ෂේපයක් |
| **III** | **T + S** | සුදු ජෙලටිනීය අවක්ෂේපයක් |
| **IV** | **U + R** | සුදු අවක්ෂේපයක් |
| **V** | **P + Q** | සුදු අවක්ෂේපයක්, රත් කළවිට කළුපැහැ ගනී |
| **VI** | **P + U** | සුදු අවක්ෂේපයක්, රත් කළවිට ද්‍රාවණය වේ |

(i) **P** සිට **U** හඳුනාගන්න.

**P:** $Pb(Ac)_2$ **Q:** $Na_2S_2O_3$ **R:** $H_2SO_4$

**S:** $Al_2(SO_4)_3$ හෝ KOH **T:** KOH හෝ $Al_2(SO_4)_3$ **U:** $BaCl_2$

**(05 X 6 = 30)**

(ii) ඉහත **I** සිට **VI** දක්වා ඇති එක් එක් ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.

**I:** $2KOH + H_2SO_4 \rightarrow K_2SO_4 + 2H_2O$ හෝ (03)
$Al_2(SO_4)_3 + H_2SO_4 \rightarrow$ ප්‍රතික්‍රියාවක් නොමැත

**II:** $Pb(Ac)_2 + H_2SO_4 \rightarrow PbSO_4\downarrow + 2HAc$ (03)

**III:** $6KOH + Al_2(SO_4)_3 \rightarrow 2Al(OH)_3\downarrow + 3K_2SO_4$ (03)

**IV:** $BaCl_2 + H_2SO_4 \rightarrow BaSO_4\downarrow + 2HCl$ (03)

**V:** සුදු අවක්ෂේපය සෑදීම: $Pb(Ac)_2 + Na_2S_2O_3 \rightarrow PbS_2O_3\downarrow + 2NaAc$ (03)
රත් කළවිට කළුපැහැ ගැනීම: $PbS_2O_3 + H_2O \rightarrow PbS\downarrow + H_2SO_4$ (02)

**VI:** $Pb(Ac)_2 + BaCl_2 \rightarrow PbCl_2\downarrow + Ba(Ac)_2$ (03)

(**සැ.යු.** : අවක්ෂේප ⬇ යනුවෙන් දක්වන්න.)
සටහන; අවක්ශේප ↓ ලෙස හෝ (s) ලෙස පෙන්විය යුතුය.
එසේ නොමැති නම් ලකුණු 01 අඩු කරන්න.

**2(b): ලකුණු 50**

**3.** (*a*) ජලයේ අල්ප වශයෙන් දියවන $AB_2(s)$ නම් ලවණයෙහි සංතෘප්ත ජලීය ද්‍රාවණයක්, 25 °C දී ආසුත ජලය $1.0\ dm^3$ තුළ $AB_2(s)$ වැඩිපුර ප්‍රමාණයක් මන්ථනය කිරීමෙන් සාදන ලදී. මෙම සංතෘප්ත ජලීය ද්‍රාවණයේ පවතින $A^{2+}(aq)$ අයන ප්‍රමාණය $2.0 \times 10^{-3}$ mol බව සොයා ගන්නා ලදී.

(i) 25 °C දී ඉහත පද්ධතියේ $AB_2(s)$ හි ද්‍රාව්‍යතාව හා සම්බන්ධ සමතුලිතය ලියා දක්වන්න.

$AB_2(s) \rightleftharpoons A^{2+}(aq) + 2B^-(aq)$ (05)

(ii) 25 °C දී ඉහත (i) හි ලියන ලද සමතුලිතතාවයේ සමතුලිතතා නියතය සඳහා ප්‍රකාශනය ලියා දක්වන්න.

$K_{sp} = [A^{2+}(aq)][B^-(aq)]^2$ (05)

$K_c = \frac{[A^{2+}(aq)][B^-(aq)]^2}{[AB_2(s)]}$ සටහන: $K_c$ පමණක් දී ඇත්නම් ලකුණු 03ක් ප්‍රදානය කරන්න.

PAPERMASTER.LK

(iii) 25 °C දී ඉහත (ii) හි සඳහන් කළ සමතුලිතතා නියතයේ අගය ගණනය කරන්න.

$[A^{2+}(aq)] = 2.0 \times 10^{-3} mol\ dm^{-3}$ (04+01)

$[B^{-}(aq)] = 2[A^{2+}(aq)] = 4.0 \times 10^{-3} mol\ dm^{-3}$ (04+01)

$K_{sp} = 2.0 \times 10^{-3} mol\ dm^{-3} \times (4.0 \times 10^{-3} mol\ dm^{-3})^2$ (05)

$K_{sp} = 3.2 \times 10^{-8} mol^3\ dm^{-9}$ $K_{sp}$ සඳහා ලකුණු ප්‍රදානය කිරීමට ඒකක අවශ්‍ය නැත (05)

(iv) $AB_2$ හි වෙනත් සංතෘප්ත ජලීය ද්‍රාවණයක්, 25 °C දී ආසුත ජලය $2.0\ dm^3$ තුළ $AB_2(s)$ වැඩිපුර ප්‍රමාණයක් මන්ථනය කිරීමෙන් සාදා ගන්නා ලදී. මෙම පද්ධතිය සඳහා සමතුලිතතා නියතයේ අගය හේතු දක්වමින් පුරෝකථනය කරන්න.

$K_{sp} = 3.2 \times 10^{-8} mol^3\ dm^{-9}$ (05)

නියත උෂ්ණත්වයේදී $K_{sp}$ නියතයකි (05)

සහ, පරිමාව මත රඳා නොපතී (05)

(v) 25 °C හි පවතින $AB_2$ හි ජලීය සංතෘප්ත ද්‍රාවණයකට NaB(s) නැමැති ප්‍රබල විද්‍යුත් විච්ඡේදකයක ස්වල්ප ප්‍රමාණයක් එකතු කරන ලදී. $A^{2+}(aq)$ වල සාන්ද්‍රණය වැඩිවේ ද, අඩුවේ ද යන වග හේතු දක්වමින් පුරෝකථනය කරන්න.

$B^{-}(aq)$ පොදු අයනයක් එකතු කර ඇත (05)

$\therefore$ $K_{sp}$ නියතව තබා ගැනීම සඳහා වැඩිපුර $AB_2(s)$ සෑදේ හෝ ආපසු ප්‍රතික්‍රියාව සිදුවේ. (05)

$[A^{2+}(aq)]$, අඩු වේ (05)

**3(a): ලකුණු 60**

(*b*) ජලීය ද්‍රාවණයකදී ප්‍රොපනොයික් අම්ලය ($C_2H_5COOH$) පහත දැක්වෙන ආකාරයට අයනීකරණය වේ.

$$C_2H_5COOH(aq) + H_2O(l) \rightleftharpoons C_2H_5COO^-(aq) + H_3O^+(aq)$$

25 °C දී $K_a$ (ප්‍රොපනොයික් අම්ලය) $= 1.0 \times 10^{-5}$ වේ.

(i) 25 °C දී ඉහත ප්‍රතික්‍රියාවේ සමතුලිතතා නියතය සඳහා ප්‍රකාශනය ලියා දක්වන්න.

$$K_a = \frac{[C_2H_5COO^-(aq)][H_3O^+(aq)]}{[C_2H_5COOH(aq)]}$$ (05)

(ii) 25 °C දී $C_2H_5COOH$ වලින් $0.74\ cm^3$ ආසුත ජලයේ ද්‍රවණය කිරීමෙන් $C_2H_5COOH$ හි $100.0\ cm^3$ ක ජලීය ද්‍රාවණයක් සාදාගන්නා ලදී. 25 °C දී මෙම ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න.
(C = 12; O = 16; H = 1; $C_2H_5COOH$ වල ඝනත්වය $1.0\ g\ cm^{-3}$ ලෙස සලකන්න.)

$C_2H_5COOH(aq)$ ස්කන්ධය $= 0.74\ cm^3 \times 1.00\ g\ cm^{-3} = 0.74\ g$

$100\ cm^3$ ක ඇති $C_2H_5COOH(aq)$ ස්කන්ධය$= 0.74\ g / 74\ g\ mol^{-1} = 0.01\ mol$ (05)

$\therefore [C_2H_5COOH(aq)] = 0.10\ mol\ dm^{-3}$ (05)

පහත සමතුලිතතාවය සළකන්න:

$$C_2H_5COOH(aq) + H_2O(l) \rightleftharpoons C_2H_5COO^-(aq) + H_3O^+(aq)$$

| | | | | |
|---|---|---|---|---|
| *ආරම්භක* | *0.10* | *0* | *0* | *mol dm⁻³* |
| *වෙනස* | *-x* | *x* | *x* | *mol dm⁻³* |
| *සමතුලිත* | *0.10-x* | *x* | *x* | *mol dm⁻³* (04+01) |

$$K_a = \frac{[C_2H_5COO^-(aq)][H_3O^+(aq)]}{[C_2H_5COOH\ \ (aq)]} = \frac{x.x}{0.10-x} = 1.0 \times 10^{-5}$$ (02)

$\frac{x^2}{0.10} = 1.0 \times 10^{-5}$ $(0.10 - x \sim 0.1)$ (03)

$x^2 = 1.0 \times 10^{-6}$

$x = 1.0 \times 10^{-3}\ mol\ dm^{-3} = H_3O^+(aq)]$ (05)

$pH = -log\ [H_3O^+(aq)] = -log\ 1.0 \times 10^{-3}$ (05)

***pH = 3.0*** (05)

සටහන: $= K_a\ \frac{[C_2H_5COO^-(aq)][H_3O^+(aq)]}{[C_2H_5COOH\ \ (aq)]}$ දෙපැත්තේම –log යොදා pH ගණනය කර තිබිය හැක. සුදුසු පරිදි ලකුණු ප්‍රදානය කරන්න.
ලකුණු ප්‍රදානය කිරීම සඳහා භෞතික තත්ත්ව අවශ්‍ය වේ.

**3(b): ලකුණු 40**

PAPERMASTER.LK

**4.** (*a*) **A, B, C** සහ **D** යනු අණුක සූත්‍රය $C_6H_{10}$ සහිත ව්‍යුහ සමාවයවික වේ. මේවායින් එකක්වත් ප්‍රකාශ සමාවයවිකතාවය නොපෙන්වයි. **A, B, C** සහ **D** යන සමාවයවික හතරම, $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග පිරියම් කළවිට ලබාදෙන ඵල 2,4-ඩයිනයිට්‍රොෆෙනිල්හයිඩ්‍රසීන් (2,4-DNP) සමග ප්‍රතික්‍රියා කර වර්ණවත් අවක්ෂේප ලබා දෙයි.

ඇමෝනීකෘත $AgNO_3$ සමග **A** පමණක් අවක්ෂේපයක් ලබා දෙයි. **A** සඳහා එක් ස්ථාන සමාවයවිකයක් පමණක් ඇති අතර, එය **B** වේ. **B** යනු **C** හි දාම සමාවයවිකයක් වේ. **C,** $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කර **E** සහ **F** ඵල දෙක ලබා දෙයි. **D,** $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කර, එක් ඵලයක් පමණක් ලබාදෙන අතර, එය **E** වේ.

(i) **A, B, C, D, E** සහ **F** වල ව්‍යුහයන් පහත දී ඇති කොටු තුළ අඳින්න.

| | | |
|---|---|---|
| $CH_3CH(CH_3)CH_2C\equiv CH$ | $CH_3CH(CH_3)C\equiv CCH_3$ | $CH_3CH_2CH_2C\equiv CCH_3$ |
| **A** | **B** | **C** |
| $CH_3CH_2C\equiv CCH_2CH_3$ | $CH_3CH_2CH_2C(=O)CH_2CH_3$ | $CH_3CH_2CH_2CH_2C(=O)CH_3$ |
| **D** | **E** | **F** |

**(06 x6 = 36)**

(ii) $H_2$ / Pd-$BaSO_4$ / ක්විනොලීන් සමග **A, B, C** සහ **D** සංයෝග වෙන වෙනම ප්‍රතික්‍රියා කළවිට, කුමන සංයෝගය පාරත්‍රිමාන සමාවයවිකතාවය නොපෙන්වන ඵලයක් ලබාදෙන්නේ ද?

$$CH_3CH(CH_3)CH_2C\equiv CH$$

නිවැරදි ව්‍යුහයට අදාල අක්ෂරය (**A**, **B**, **C** හෝ **D**) **(05)**

(iii) **A** වැඩිපුර HBr සමග ප්‍රතික්‍රියා කර ලබාදෙන **G** ඵලයේ ව්‍යුහය පහත දී ඇති කොටුව තුළ අඳින්න.

$$CH_3CH(CH_3)CH_2CBr_2-CH_3$$

**G** **(05)**

(iv) **E** පහත දී ඇති ප්‍රතික්‍රියාවලදී ලබාදෙන **X** සහ **Y** ඵලවල ව්‍යුහ අදාළ කොටු තුළ අඳින්න.

$$\underset{\mathbf{X}}{CH_3CH_2CH_2CH(OH)CH_2CH_3} \xleftarrow[\text{මෙතනෝල්}]{NaBH_4} \mathbf{E} \xrightarrow[2.\ H^+/H_2O]{1.\ C_2H_5MgBr} \underset{\mathbf{Y}}{CH_3CH_2CH_2C(OH)(CH_2CH_3)CH_2CH_3}$$

**X** සහ **Y** එකිනෙකින් වෙන් කර හඳුනාගැනීමට පරීක්ෂාවක් නම් කරන්න. **(05 x 2 = 10)**

ලූකස් පරීක්ෂාව හෝ

නිර්ජලීය $ZnCl_2$ / සාන්ද්‍ර HCl හෝ

$H^+/K_2Cr_2O_7$ හෝ

$H^+/KMnO_4$ **(04)**

සටහන: $C_3H_7$ ලෙස ලියා ඇති නම් ලකුණු ප්‍රදානය නොකරන්න.

**4(a): ලකුණු 60**

PAPERMASTER.LK

(*b*) (i) දී ඇති කොටු තුළ **K, L** සහ **M** සංයෝගවල ව්‍යුහ ඇඳීමෙන් සහ **P, Q** සහ **R** ප්‍රතිකාරක/උත්ප්‍රේරක දෙමින් පහත දී ඇති ප්‍රතික්‍රියා අනුක්‍රම තුන සම්පූර්ණ කරන්න.

අනුක්‍රමය **1:**




HBr/ පෙරොක්සයිඩ්

**P**



**K**

අනුක්‍රමය **2:**







**L**

$CH_3COCl/AlCl_3$

**Q**




**M**

අනුක්‍රමය **3:**




$C_6H_5NH_2$

**R**

සංයෝග/ ප්‍රතිකාරක **(05 x 6 = 30)**

(ii) ප්‍රතික්‍රියා **I – VI** අතුරෙන් තෝරාගනිමින් පහත දක්වා ඇති එක් එක් ප්‍රතික්‍රියා වර්ගය සඳහා **එක් (01)** නිදසුනක් බැගින් දෙන්න.

න්‍යෂ්ටිකාමී ආකලනය ............ ප්‍රතික්‍රියාව - V

න්‍යෂ්ටිකාමී ආදේශය ............ ප්‍රතික්‍රියාව - II

ප්‍රතික්‍රියා **(05 x 2 = 10)**

**4(b): ලකුණු 40**

PAPERMASTER.LK

## B කොටස

5. (a) $XY_2Z_2(g)$ නමැති සංයෝගය 300 K ට වඩා ඉහළ උෂ්ණත්වවලට රත්කළ විට පහත පරිදි වියෝජනය වේ.

$$XY_2Z_2(g) \overset{\Delta}{\rightleftharpoons} XY_2(g) + Z_2(g)$$

$XY_2Z_2(g)$ හි 7.5 g ක සාම්පලයක් රේචනය කරන ලද $1.00\ dm^3$ දෘඪ-සංවෘත බඳුනක් තුළ තබා උෂ්ණත්වය 480 K දක්වා වැඩිකරන ලදී.
$XY_2Z_2(g)$ හි මවුලික ස්කන්ධය $150\ g\ mol^{-1}$ වේ. 480 K හිදී $RT$ හි ආසන්න අගය ලෙස $4000\ J\ mol^{-1}$ යොදාගන්න. සියලුම වායූන් පරිපූර්ණ වායු ලෙස හැසිරෙන බව උපකල්පනය කරන්න.

(i) වියෝජනය වීමට පෙර භාජනය තුළ ඇති $XY_2Z_2(g)$ මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

$7.5g/150\ g\ mol^{-1} = 5.0 \times 10^{-2}\ mol$ **(05)**

**5(a) (i): ලකුණු 05**

(ii) ඉහත පද්ධතිය 480 K දී සමතුලිතතාවයට එළඹී විට භාජනය තුළ ඇති මුළු මවුල ප්‍රමාණය $7.5 \times 10^{-2}$ mol බව සොයාගන්නා ලදී. 480 K දී සමතුලිතතා මිශ්‍රණය තුළ ඇති $XY_2Z_2(g)$, $XY_2(g)$ සහ $Z_2(g)$ හි මවුල සංඛ්‍යා ගණනය කරන්න.

$$XY_2Z_2(g) \rightleftharpoons XY_2(g) + Z_2(g)$$

| | $XY_2Z_2(g)$ | $XY_2(g)$ | $Z_2(g)$ | | |
|---|---|---|---|---|---|
| ආරම්භක | *0.05* | *0* | *0* | $mol\ dm^{-3}$ | **(04+01)** |
| වෙනස | *-x* | *x* | *x* | $mol\ dm^{-3}$ | |
| සමතුලිත | *0.05-x* | *x* | *x* | $mol\ dm^{-3}$ | **(04+01)** |

මුළු මවුල ගණන $= 0.05+x = 7.5 \times 10^{-2}$ mol **(04+01)**

$x = 2.5 \times 10^{-2}$ mol **(04+01)**

$XY_2(g) = Z_2(g) = 2.5 \times 10^{-2}$ mol **(04+01)**

$XY_2Z_2(g) = 5.0 \times 10^{-2}$ mol $- 2.5 \times 10^{-2}$ mol $= 2.5 \times 10^{-2}$ mol **(04+01)**

**5(a) (ii): ලකුණු 30**

(iii) 480 K දී මෙම ප්‍රතික්‍රියාව සඳහා සමතුලිතතා නියතය $K_c$ ගණනය කරන්න.

$$K_c = \frac{[XY_2(g)\ ][Z_2(g)]}{[XY_2Z_2(g)]}$$ **(05)**

සාන්ද්‍රණය $= 2.5 \times 10^{-2}\ mol\ dm^{-3}$ **(04+01)**

$$K_c = \frac{2.5 \times 10^{-2}\ mol\ dm^{-3} \times 2.5 \times 10^{-2}\ mol\ dm^{-3}}{2.5 \times 10^{-2}\ mol\ dm^{-3}}$$ **(04+01)**

$\boldsymbol{K_c = 2.5 \times 10^{-2}\ (mol\ dm^{-3})}$ (ඒකක අවශ්‍ය නැත) **(05)**

**5(a) (iii): ලකුණු 20**

(iv) 480 K දී සමතුලිතතාවය සඳහා $K_p$ ගණනය කරන්න.

$K_p = K_c(RT)^{\Delta n}$ **(05)**

$\Delta n = 1$ **(05)**

$K_p = 2.5 \times 10^{-2}\ mol\ dm^{-3} \times 4 \times 10^3\ J\ mol^{-1}$ **(04+01)**

$\boldsymbol{K_p = 1.0 \times 10^5\ (Pa)}$ (ඒකක අවශ්‍ය නැත) **(05)**

**5(a) (iv): ලකුණු 20**

PAPERMASTER.LK

***iv. විකල්ප පිළිතුරු:***

සමතුලිතතාවයේදී ඇති මුළු මවුල ගණන = $7.5 \times 10^{-2}$ mol (05)

$P_{Total} = (7.5 \times 10^{-2}\ mol \times 4 \times 10^{3}\ J\ mol^{-1})/1.0 \times 10^{-3}\ m^{3}) = 3.0 \times 10^{5}\ Pa)$ (04+01)

මවුල $XY_2\ Z_2(g) = XY_2(g) = Z_2(g) = 2.5 \times 10^{-2}$ mol (04+01)

මවුල භාග $XY_2\ Z_2(g) = XY_2(g) = Z_2(g) = 1/3$

$P_i = X_i\ P_{total}$

$P_{XY2\ Z2(g)} = P_{XY2(g)} = P_{Z2(g)} = 1.0 \times 10^{5}$ Pa

$K_p = [P_{XY2(g)} = P_{Z2(g)}] / P_{XY2\ Z2(g)} = \mathbf{1.0 \times 10^{5}\ Pa}$ (05)

**5(a): ලකුණු 75**

(*b*) ඉහත (*a*) හි විස්තර කළ ප්‍රතික්‍රියාව වන $XY_2Z_2(g) \rightarrow XY_2(g) + Z_2(g)$ සඳහා 480 K හිදී, $XY_2Z_2(g)$, $XY_2(g)$ සහ $Z_2(g)$ හි ගිබ්ස් ශක්තීන් (*G*) පිළිවෙළින් $-60\ kJ\ mol^{-1}$, $-76\ kJ\ mol^{-1}$ සහ $-30\ kJ\ mol^{-1}$ වේ.

(i) 480 K දී ප්‍රතික්‍රියාවෙහි $\Delta G$ ($kJ\ mol^{-1}$ වලින්) ගණනය කරන්න.

$$XY_2Z_2(g) \rightarrow XY_2(g) + Z_2(g)$$

$\Delta G_{rxn} = G_{ඵල} - G_{ප්‍රතික්‍රියක}$ (05)

$= (-76 + (-30)) - (-60) = \mathbf{-46\ kJ\ mol^{-1}}$ (04+01)

**සටහන: $\Delta G^0$ ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න නමුත් නිවැරදි ගණනය සඳහා ලකුණු ප්‍රදානය කරන්න.**

**5(b) (i): ලකුණු 10**

(ii) ඉහත ප්‍රතික්‍රියාවෙහි 480 K දී $\Delta S$ හි විශාලත්වය 150 $J\ K^{-1}\ mol^{-1}$ වේ. $\Delta S$ සඳහා නිවැරදි ලකුණ (+ හෝ –) භාවිත කරමින් 480 K දී ප්‍රතික්‍රියාව සඳහා $\Delta H$ ගණනය කරන්න.

$\Delta S$ ධන වේ. (ඵලවල වැඩි වායුමය මවුල ප්‍රමාණයක් ඇත) (05)

$\Delta G = \Delta H - T\Delta S$ (05)

$-46\ kJ\ mol^{-1} = \Delta H - 480\ K \times 150 \times 10^{-3}\ kJ\ K^{-1} mol^{-1}$

$\Delta H = -46\ kJ\ mol^{-1} + 72\ kJ\ mol^{-1}$ (04 +01)

$\mathbf{\Delta H = +26\ kJ\ mol^{-1}}$ (04+01)

**සටහන: $\Delta G^0$ ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න. නමුත් නිවැරදි ගණනය සඳහා ලකුණු ප්‍රදානය කරන්න.**

**5(b) (ii): ලකුණු 20**

(iii) ඉහත (ii) හි ලබාගත් $\Delta H$ හි ලකුණ (+ හෝ –) අනුව මෙම ප්‍රතික්‍රියාව තාපදායක ද තාපාවශෝෂක ද යන වග පැහැදිලි කරන්න.

ප්‍රතික්‍රියාව තාප අවශෝෂකය (05)

$\Delta H$ ධන නිසා. (05)

**5(b) (iii): ලකුණු 10**

(iv) 480 K දී $XY_2(g)$ හා $Z_2(g)$ මගින් $XY_2Z_2(g)$ සෑදීමේදී එන්තැල්පි වෙනස අපෝහනය කරන්න.

$\mathbf{H = -26\ kJ\ mol^{-1}}$ (09 +01)

**5(b) (iv): ලකුණු 10**

PAPERMASTER.LK

(v) $XY_2Z_2(g)$ හි X–Z බන්ධනයෙහි බන්ධන එන්තැල්පිය +250 kJ mol$^{-1}$ වේ නම් Z–Z බන්ධනයෙහි බන්ධන එන්තැල්පිය ගණනය කරන්න. ($XY_2Z_2(g)$ හි ව්‍යුහය Z—X(=Y)(=Y)—Z බව සලකන්න.)

$\Delta H_{rxn}$ = $\Delta H$ බන්ධන කැඩීම − $\Delta H$ බන්ධන සෑදීම **(05)**

$$\Delta H_{rxn} = 2\,\Delta H_{X-Z} - \Delta H_{Z-Z}$$ **(05)**

$$26\ kJ\ mol^{-1} = 2 \times 250\ kJ\ mol^{-1} - \Delta H_{Z-Z}$$

$$\boldsymbol{\Delta H_{Z-Z} = 474\ kJ\ mol^{-1}}$$ **(04+01)**

**හෝ**

**(තාප රසායනික චක්‍රය මගින්ද විසඳිය හැක.)**

**5(b) (v): ලකුණු 15**

(vi) වායුමය $XY_2Z_2$ වෙනුවට ද්‍රව $XY_2Z_2$ භාවිත කළේනම්, එවිට $XY_2Z_2(l) \rightarrow XY_2(g) + Z_2(g)$ ප්‍රතික්‍රියාව සඳහා ලැබෙන $\Delta H$ හි අගය ඉහත (ii) හි ලබාගත් $\Delta H$ හි අගයට සමාන ද, නැතහොත් වඩා විශාල ද හෝ කුඩා ද යන වග හේතු දක්වමින් පහදන්න.

**ඉහළය** **(05)**

**ද්‍රව වායු බවට පත්කිරීම සඳහා ශක්තිය ලබා දිය යුතුය.** **(05)**

**හෝ $XY_2Z_2(l) \rightarrow XY_2Z_2(g)$ සඳහා වැඩිපුර ශක්තිය අවශ්‍ය වේ.**

**5(b) (vi): ලකුණු 10**

**සටහන :ලකුණු ප්‍රදානය කිරීම සඳහා භෞතික තත්ත්ව අවශ්‍ය වේ.**

| **5(b): ලකුණු 75** |
|---|

**6.** (*a*) දී ඇති *T* උෂ්ණත්වයේදී සංවෘත බඳුනක් තුළ සිදුවන පහත දක්වා ඇති ප්‍රතික්‍රියාව සලකන්න.

$$2N_2O_5(g) \rightarrow 4NO_2(g) + O_2(g)$$

(i) ප්‍රතික්‍රියාවේ දක්වා ඇති එක් එක් සංයෝගයට අදාළව ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව සඳහා ප්‍රකාශන **තුනක්** ලියන්න.

$$\text{සීඝ්‍රතාව} = -\frac{\Delta[N_2O_5(g)]}{2\,\Delta t} = \frac{\Delta[NO_2(g)]}{4\,\Delta t} = \frac{\Delta[O_2(g)]}{\Delta t}$$ **(02+02+01)**

**6(a) (i): ලකුණු 05**

(ii) මෙම ප්‍රතික්‍රියාව, *T* උෂ්ණත්වයේදී, $N_2O_5(g)$ හි 0.10 mol dm$^{-3}$ ආරම්භක සාන්ද්‍රණයක් සහිතව සිදු කරන ලදී. 400 s කාලයකට පසුව ආරම්භක ප්‍රමාණයෙන් 40% ක් වියෝජනය වී ඇති බව සොයාගන්නා ලදී.

I. මෙම කාල පරාසයේදී $N_2O_5(g)$ වියෝජනය වීමේ සාමාන්‍ය ශීඝ්‍රතාව (average rate of decomposition) ගණනය කරන්න.

වියෝජනය වූ ප්‍රමාණය = 0.10 mol dm$^{-3}$×40/100 = $4.0 \times 10^{-2}$ mol dm$^{-3}$ **(04+01)**

400 s කට පසු ඉතිරි සාන්ද්‍රණය = $6.0 \times 10^{-2}$ mol dm$^{-3}$ **(04+01)**

$$\text{මධ්‍යන වේගය} = \frac{-(0.06 - 0.10)\ mol\ dm^{-3}}{(400-0)s} = 1.0 \times 10^{-4}\ mol\ dm^{-3}s^{-1}$$ **(04+01)**

PAPERMASTER.LK

II. $NO_2(g)$ සහ $O_2(g)$ සෑදෙන සාමාන්‍ය ශීඝ්‍රතාවයන් (average rates of formation) ගණනය කරන්න.

$$\frac{\Delta[N_2O_5(g)]}{2\,\Delta t} = \frac{\Delta[NO_2(g)]}{4\,\Delta t}$$

$$\frac{\Delta[NO_2(g)]}{\Delta t} = 2.0 \times 10^{-4}\, mol\, dm^{-3} s^{-1}$$ **(02)**

$$\frac{\Delta[O_2(g)]}{\Delta t} = \frac{\Delta[N_2O_5(g)]}{2\,\Delta t} = 5.0 \times 10^{-5}\, mol\, dm^{-3} s^{-1}$$ **(03)**

**6(a) (ii): ලකුණු 20**

(iii) වෙනත් පරීක්ෂණයකදී, මෙම ප්‍රතික්‍රියාව සඳහා 300 K දී ආරම්භක ශීඝ්‍රතා මනින ලද අතර, එහි ප්‍රතිඵල පහත දක්වා ඇත.

| $[N_2O_5(g)]$ / mol $dm^{-3}$ | 0.01 | 0.02 | 0.03 |
|---|---|---|---|
| ආරම්භක ශීඝ්‍රතාව / mol $dm^{-3}$ $s^{-1}$ | $6.930 \times 10^{-5}$ | $1.386 \times 10^{-4}$ | $2.079 \times 10^{-4}$ |

300 K දී ප්‍රතික්‍රියාව සඳහා ශීඝ්‍රතා ප්‍රකාශනය ව්‍යුත්පන්න කරන්න.

සාන්ද්‍රණය දෙගුණ හා තෙගුණ කල විට සීඝ්‍රතාවයන් පිළිවලින් දෙගුණ හා තෙගුණ වේ **(05)**

∴ ප්‍රතික්‍රියාව පළමු පෙළ වේ. **(05)**

∴ වේග ප්‍රකාශනය; සීඝ්‍රතාව = $k\,[N_2O_5(g)]$ **(05)**

(හෝ $R_1/R_2 = 1/2$ ::::: ප්‍රතික්‍රියාව පළමු පෙළ වේ.)

**6(a) (iii): ලකුණු 15**

(iv) වෙනත් පරීක්ෂණයක් 300 K දී $N_2O_5(g)$ හි 0.64 mol $dm^{-3}$ ආරම්භක සාන්ද්‍රණයක් සහිතව සිදු කරන ලදී. 500 s කාලයකට පසුව ඉතිරි වී ඇති $N_2O_5(g)$ සාන්ද්‍රණය $2.0 \times 10^{-2}$ mol $dm^{-3}$ බව සොයාගන්නා ලදී.

I. 300 K දී ප්‍රතික්‍රියාවේ අර්ධ-ජීව කාලය ($t_{1/2}$) ගණනය කරන්න.

සාන්ද්‍රණ වෙනසෙහි බලය $= 0.64/2.0 \times 10^{-2} = 32 = (2)^5$ **(05)**

∴ ආරම්භක $N_2O_5(g)$ හි භාගය $= (1/2)^5$ **(05)**

අර්ධ ජීව කාල පහක් පහක් පසුවේ. **(05)**

**∴ $t_{1/2} = 500\ s/5 = 100\ s$** **(04+01)**

II. 300 K දී ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතා-නියතය ගණනය කරන්න.

ප්‍රතික්‍රියාව පළමු පෙළ නිසා: $t_{1/2} = 0.693/k$ **(05)**

∴ $k = 0.693/100\ s = 6.93 \times 10^{-3}\ s^{-1}$ **(04+01)**

හෝ

තුන්වන කොටසින්,
සීඝ්‍රතාව $= k\,[N_2O_5(g)] = 6.93 \times 10^{-5}\ mol\ dm^{-3}\ s^{-1} = k\ 0.01\ mol\ dm^{-3}$ **(04+01)**

**$k = 6.93 \times 10^{-3}\ s^{-1}$** **(04+01)**

**6(a) (iv): ලකුණු 30**

PAPERMASTER.LK

(v) මෙම ප්‍රතික්‍රියාව පහත සඳහන් මූලික පියවර සහිත යන්ත්‍රණයක් හරහා සිදුවේ.

පියවර 1 : $N_2O_5(g) \rightleftharpoons NO_3(g) + NO_2(g)$ : වේගවත්

පියවර 2 : $NO_3(g) + NO_2(g) \rightarrow 2NO_2(g) + O(g)$ : සෙමින්

පියවර 3 : $N_2O_5(g) + O(g) \rightarrow 2NO_2(g) + O_2(g)$ : වේගවත්

ඉහත යන්ත්‍රණය ප්‍රතික්‍රියාවෙහි වේග නියමයට අනුකූල වන බව පෙන්වන්න.

*සෙමෙන් සිදුවන පියවර 02න්;*

ශීඝ්‍රතාවය= $k[NO_3(g)]\,[NO_2(g)]$ **(05)**

*සමතුලිත පියවර 1න්*

$K_{eq} = \{[NO_3(g)]\,[NO_2(g)]\} / [N_2O_5(g)]$ **(05)**

$K_{eq}\,[N_2O_5(g)] = \{[NO_3(g)]\,[NO_2(g)]\}$

$\therefore$ සීඝ්‍රතාවය $= k\,K_{eq}\,[N_2O_5(g)] = k`[N_2O_5(g)]$ **(05)**

**මෙය ඉහත (iii) හි ලබාගත් වේග ප්‍රකාශණය සහිත පළමු පෙල ප්‍රතික්‍රියාවක් වේ.** **(05)**

**සටහන :ලකුණු ප්‍රදානය කිරීම සඳහා භෞතික තත්ත්ව අවශ්‍ය වේ.** **6 (a) (v): ලකුණු 20**

**6(a): ලකුණු 90**

(*b*) $T$ උෂ්ණත්වයේදී **A** සහ **B** නමැති ද්‍රව දෙකක් රේචනය කළ සංවෘත බඳුනක් තුළ මිශ්‍ර කිරීමෙන් පරිපූර්ණ ද්වයංගී ද්‍රව මිශ්‍රණයක් සාදන ලදී. $T$ උෂ්ණත්වයේදී සමතුලිතතාවයට එළඹී පසු වාෂ්ප කලාපයෙහි **A** සහ **B** හි ආංශික වාෂ්ප පීඩන පිළිවෙළින් $P_A$ සහ $P_B$ වේ. $T$ උෂ්ණත්වයේදී **A** සහ **B** හි සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙළින් $P_A^\circ$ සහ $P_B^\circ$ වේ. ද්‍රාවණය තුළ **A** සහ **B** හි මවුලභාග පිළිවෙළින් $X_A$ සහ $X_B$ වේ.

(i) $P_A = P_A^\circ X_A$ බව පෙන්වන්න.
(සමතුලිත අවස්ථාවේදී වාෂ්පීකරණයේ හා ඝනීභවනයේ ශීඝ්‍රතාවයන් සමාන බව සලකන්න.)

ඉහත වායු 3 ම සමතුලිතතාවය සැලකූ විට වාෂ්පීකරණයේ හා ඝණීභවනයේ වේගයන් සමාන වන නිසා

$$A_{(l)} \underset{r_c}{\overset{r_v}{\rightleftharpoons}} A_{(g)} \;\ldots\ldots\ldots (1)$$ **(05)**

$r_v$ සහ $r_c$ යනු වාෂ්පීකරණ හා ඝණීභවන වේගයන් වේ.

(1) සලකා

$$r_v = k\,[A_{(l)}] = k_1 X_A$$ **(05)**

PAPERMASTER.LK

$X_A$ යනු ද්‍රව කලාපයේ ඇති A හි මවුල භාගය වේ.

එසේම,

$$r'_v = k'[A_{(g)}] = k_2 P_A$$ (05)

$P_A$ යනු වාෂ්ප කලාපයේ ඇති A හි ආංශික පීඩනය වේ.

සමතුලිතතාවයේදී,

$$r_v = r'_v$$

$$k_2 P_A = k_1 X_A$$ (05)

$$\therefore P_A = \frac{k_1}{k_2} X_A \quad or \quad \therefore P_A = k X_A$$ (05)

$X_A = 1$ වන විට $P_A = P_A^0 = A$ හි සංතෘප්ත වාෂ්ප පීඩනය

$$\therefore k = P_A^0$$ (05)

$$\therefore P_A = P_A^0 X_A$$ (05)

**6 (b) (i): ලකුණු 35**

(ii) 300 K දී ඉහත පද්ධතියේ මුළු පීඩනය $5.0 \times 10^4$ Pa වේ. 300 K හිදී සංශුද්ධ **A** සහ **B** හි සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙළින් $7.0 \times 10^4$ Pa හා $3.0 \times 10^4$ Pa වේ.

I. සමතුලිත මිශ්‍රණයෙහි ද්‍රව කලාපයේ ඇති **A** හි මවුලභාගය ගණනය කරන්න.

